**අරණායක ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 12 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 11 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 28 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 1,531,099 ක එකතු වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන හා ඊට අදාල උපයෝගී ලේඛන සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | සේවක ණය සම්බන්ධයෙන් තොරතුරු පරීක්ෂා කර නිවැරදි කර ගැනීමට හා විවිධ තැන්පත් හා සේවක ඇප තැන්පත් ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | එකතුව රු. 8,409,744 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළව උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් විෂයයන් තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි ආකාරයට යාවත්කාලීන කර නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. |

## 1.4 අනුකූල නොවීම්

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| දින රහිත අංක 01/2010 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 7.4(ii)(iii)(iv) ඡේද | ලිඛිත දැනුම් දීමකින් තොරව සභා රැස්වීම් වලට පැමිණ නොමැති අවස්ථා 22 ක් සඳහා සභිකයින්ට රු.335,000 ක්වූ සභික දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. | සභාව විසින් නිවාඩු අනුමත කල බව සහා වාර්තාවල සඳහන් වී ඇති හෙයින් එදින සභාවට නොපැමිණියද එම මන්ත්‍රී වරුන්හට දීමනාව ගෙවන ලද අතර ඉදිරියේදී චක්‍රලේඛය පරිදි කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,815,737 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,202,140 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,783,000 | 2,607,213 | 2,493,532 | 131,187 | 2,567,000 | 2,795,823 | 2,831,791 | 108,779 |
| කුලී | 3,239,000 | 2,550,143 | 2,703,101 | 160,492 | 2,642,600 | 1,924,885 | 1,965,846 | 321,131 |
| බලපත්‍ර ගාස්තු | 560,200 | 373,483 | 374,233 | - | 360,100 | 367,352 | 367,352 | - |
| වෙනත් ආදායම් | 21,956,800 | 21,071,851 | 22,959,174 | 31,687,447 | 13,966,600 | 15,213,695 | 22,287,223 | 29,861,490 |

### 2.2.2 වරිපනම් හා බදු

#### (අ) වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු. 95,453 ක් විය. වරිපනම් බදු අයකිරීම සඳහා සහා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කළයුතු වුවද, 2011 වර්ෂයෙන් පසු දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමද, නිශ්චල දේපල නියමිත පරිදි තක්සේරු කිරීමටද කටයුතු කල යුතුය. | හිග මුදල ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන අතර නව තක්සේරුවක් කිරීම සඳහා පළාත් තක්සේරු කාර්යාලයට යොමුකර ඇතත් මෙතෙක් දිනයක් ලබාදී නොමැත. |

#### (ආ) අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 35,734 වූ අතර, ඒ තුල වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.25,236 ක් ඇතුලත්ව තිබුණි. | හිඟ ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු දේපළ සම්බන්ධයෙන් ගැටළු ඇති බැවින් ඒ සඳහා මහා සභාවට ඉදිරිපත් කර කපා හැරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2002 හා 2004 වර්ෂයන් සඳහා දිප්පිටිය සතිපොල බදු දීමට අදාලව අයවියයුතු රු.55,672 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැරණි හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2004 වර්ෂය සදහා දිප්පිටිය සතිපොළ බදුදීමට අදාල රු.20,220 ක හිගය කපාහැරීමට අනුමැතිය ලබා ගැනීමට ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ඇති අතර රු.35,452 ක හිග අය කිරීම සදහා නඩු පවරා ඇත. |
| (ආ) පැරණි ගම්සභා ගොඩනැගිල්ල සඳහා වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පවතින රු. 97,058 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පැරණි හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පැරණි ගම් සභා ගොඩනැගිල්ල සඳහා 2019 දෙසැම්බර් 31 දිනට ලේඛණය අනුව අයවිය යුතු හිග මුදල ගෙවන ලෙස දැනුවත් කර ලිපි යැවීමට කටයුතු කරමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,573,000 ක් හා මුද්දර ගාස්තු රු. 29,190,939 ක් විය. ඒ තුළ වර්ෂ 05 ක් ඉක්මවූ උසාවි දඩ මුදල් රු. 50,000 ක් හා මුද්දර ගාස්තු රු. 13,190,939 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රයේ අරමුණු 17 අතුරින් ප්‍රධාන අරමුණු තුනක් සම්බන්ධ විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයි සවිබල ගැන්වීමට වැඩමුළුවක් පැවැත්වූ බවද, දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද බව දන්වමි. |

### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතුව සුදුසු ඉඩමක් නොමැති වීම නිසා ඒ සඳහා ඉඩ පහසුකම් සහිත පුද්ගලයින් වෙත පමණක් ගලි සේවාව සපයා තිබුණි. එම හේතුවෙන් ගලි බවුසරය ද ඌන උපයෝජිතව පැවති අතර, බල ප්‍රදේශයේ ජනතාව වෙත සමාන සේවාවක් සැපයීමට | ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් ලබා ගත යුතුය. | දෙබත්ගම වත්ත ඉඩම පවරා ගැනීමෙන් හෝ මිලදී ගැනීමෙන් පසු ගලි සේවාව ඌණ උපයෝජනයෙන් තොරව කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සහිතව බල ප්‍රදේශයේ ජනතාවට ගුණාත්මක සේවාවක් සැපයීමට අපේක්ෂිත බව දන්වමි. |

ද නොහැකි වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා ගලි බැහැරලීම සඳහා සුදුසු ඉඩමක් ලබා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වූ තනතුරු 18 ක් ව පැවති අතර ඉන් තනතුරු වර්ග 8 ක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ 3 දෙනෙකු හා අනියම් පදනම යටතේ 6 දෙනෙකු බඳවාගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම පුරප්පාඩු සම්බන්ධව, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත දැණුම්දී ඇත. |
| (ආ) පුස්තකාල 02 ක් පවත්වාගෙන ගියද අනුමත පුස්තකාලාධිපති තනතුරු දෙකම පුරප්පාඩුව පවතින අතර, ආදාහනාගාරයක් පවත්වාගෙන ගියද ස්ථිර ආදාහනාගාර භාරකරු තනතුර පුරප්පාඩුව පැවතුණි. පෙර පාසල් ගුරු තනතුරක් අනුමත වුවද, එය පුරප්පාඩුව පැවතීම හේතුවෙන් පෙරපාසල් සේවා පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. | පුරප්පාඩු තනතුරු පිළිබඳව මාසිකව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතත්, ත්‍රෛමාසිකව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙතත් අඛණ්ඩව දැනුම් දී ඇති බව දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සුසාන භූමි ලේඛනය අනුව සභාව සතුව සුසාන භූමි 38 ක් පැවතියද, ඒවා මැනුම් හා පවරාගැනීම් සිදුකර දේපල ආරක්ෂා කරගැනීමට ක්‍රියාකර නොතිබුණි. | දේපල ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. | වසරකට සුසාන භූමි ඉඩම් 02 ක බැගින් පමණ මැනුම් කටයුතු කර පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

### 3.3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් වනවිට ලියාපදිංචි අයිතිය පවරා නොගත් සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන හා ටේලර් 11 ක් විය. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | වත්කම් පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

### 3.3.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 ජනවාරි 18 දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු. 784,300 ක් වූ පොලිතින් කුට්ටි කිරීමේ බේල් යන්ත්‍රය භාවිතා කිරීමෙන් තොරව පැවතුණි. | ප්‍රයෝජනට ගැනීමට හෝ අවශ්‍යතා පවතින වෙනත් සභාවක් වෙත ලබා දීමට හෝ කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | සභාවට අයත් වටිනාකම රු. 4,288,409 ක් වූ වාහන 04 ක් හා වටිනාකම රු.767,289 ක් වූ යන්ත්‍ර 02 ක්, 2009 හා 2011 වර්ෂවල සිට අක්‍රීයව පැවතියද, ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම රථ වාහන සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ පරිදි කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | අධික බර හේතුවෙන් ප්‍රවාහනය කිරීමට අපහසුවීම හා ප්‍රදේශයට උචිත නොවීම නිසා 2015 වර්ෂයේ සිටම නිෂ්කාර්යයව පවතින රු. 5,500,000 ක වටිනාකමක් සහිත යූටෝන් ගල්රෝල එම අවශ්‍යතාව සහිත වෙනත් පළාත් පාලන ආයතනයක් වෙත පවරා දීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගැනීමට හෝ උචිත ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී සිදුව තිබූ වාහන අනතුරක් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන තිබුණද, සිදුව තිබූ රු. 550,973 ක අලාභය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි | අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වශයෙන් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ගෙන් අයකිරීම සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා ඇත. |

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නිරවුල් කිරීමකින් තොරව 2001 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු. 631,350 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | තොරතුරු සොයා ගැනීමට අදාල ලිපි ලේඛන නොමැති බැවින් එය නිරවුල් කිරීමට නොහැකිව පවතී. |